**උතුරු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ වැඩිහිටි නිවාසයේ පවතින "සාදුසේවිකා"(Saathusevika) III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021**

උතුරු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ වැඩිහිටි නිවාසයේ පුරප්පාඩු වී ඇති **"සාදුසේවිකා" (Saathusevika) III** වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පැවැත්වීමට නියමිත බව දන්වා සිටින අතර ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය 05.03.2021 වන දින වේ.

## 02. බඳවා ගැනීමේ පරිපාටිය :-

02.1 **උතුරු පළාතේ සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ වැඩිහිටි නිවාසයේ පවතින "සාදු සේවිකා" III වන ශ්‍රේණියට** 2013.01.01 වැනි දින සිට බලාත්මකව පවතින සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසින්, හා ආයතන සංග්‍රහයේ විධිවිධාන ද මුදල් රෙගුලාසින් ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් බලාත්මකවූ උතුරු පළාත් රාජ්‍ය සේවයට නියමිත ආයතන කාර්ය පරිපාටි සංග්‍රහය යනාදි කරුණුවලට යටත් කොට තෝරා ගන්නා අපේක්ෂකයන් **"සාදුසේවිකා" (Saathusevika) III වන ශ්‍රේණියේ** තනතුරට පත්කරනු ලැබේ.

02.2 තරඟ විභාගයක් මඟින් සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් තනතුරට පත්වන දින සිට වසර (03) ක පරිවාස කාලයට යටත් කොට **"සාදුසේවිකා" (Saathusevika) III** වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි **"සාදුසේවිකා" (Saathusevika) III වන ශ්‍රේණියේ** තනතුරට පත් වන දින සිට **වසර තුනක් (03)** ගතවීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.3 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම බලාත්මක වන දිනය යන කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. ප්‍රසිද්ධ කරන ලද පුරප්පාඩු සංඛ්‍යාව සම්බන්ධයෙන් සුළු පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියළුම පුරප්පාඩු පිරවීමට හෝ නො පිරවීමේ බලය පත්වීම් බලධරයා සතුය. මෙම පත්වීම සඳහා මුළු පුරප්පාඩු ගණන 05 කි පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60% ක් විවෘත තරඟ විභාගයක් මඟින් පූර්ණය කරනු ලැබේ.

## 03. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, නියම කොට ඇති වැටුප් කාණ්ඩ **MN 1 – 2016** ට අනුව **"සාදුසේවිකා" (Saathusevika) III වන ශ්‍රේණියේ** තනතුරට අදාළ ඒකාබද්ධ වැටුප් අනුපාතය රුපියල් **27, 140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45, 540/-** ක් වේ. (රුපියල් 28,040/- යන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි)

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය මනා ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයන් විය යුතු අතර මනා චරිතයකින් යුත් පුද්ගලයන් ද විය යුතුයි.

04.3 උතුරු පළාත ස්ථිර පදිංචිය කරගත් අය විය යුතුයි. අදාළ ඉල්ලුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි. **(ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද උපුටනයක පිටපතක් සහතික කර ඉදිරිපත් කළ යුතුයි)**

04.4 ඉල්ලුම්පත භාරගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම අයදුම්කරු මෙම තනතුරට අදාළ **සියළුම සුදුසුකම් සපුරා තිබිය** තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර භාෂාව** (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) **ගණිතය** ඇතුළුව විෂයන් හතරකට **(04)** විශිෂ්ඨ සම්මාන සමඟ විෂයයන් හයක් (06) සමත්වී තිබීම.

ඒ සමඟම

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයකට (01) (පොදු විෂයන් හැර) සමත්වී තිබීම.

**(ආ) වෘත්තීය සුදුසුකම් :**

රජයේ වැඩිහිටි නිවාසයක හෝ රජය පිළිගත් ආයතනයකින් අවම වශයෙන් මාස **හයකට (06)** නොඅඩු වැඩිහිටියන් නඩත්තු කිරීමේ පුහුණුව හෝ මාස **හයකට (06)** නොඅඩු වැඩිහිටි නඩත්තු කිරීමට අදාළ සහතිකපත්‍ර පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුයි.

**(ඇ) වයස් සීමාව :-**

අයදුම්පත භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුගේ වයස අවුරුදු **දහඅටට** (18) නොඅඩු හා වයස අවුරුදු **හතළිහට** (40) නොවැඩි විය යුතුයි.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :-**

06.1 ලිඛිත පරීක්ෂණය මඟින් කුසලතා පදනම මත, බඳවා ගන්නා අවස්ථාවේ බලාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, අනුමත බඳවා ගැනීමේ පරිපාටි, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන්ට අදාළව **"සාදුසේවිකා" (Saathusevika) III වන ශ්‍රේණියේ** තනතුරට බඳවා ගනු ලැබේ. මෙම නිවේදනයේ අයදුම්කරුවන්ගෙන් කැඳවා ඇති සියලුම **සුදුසුකම්** සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වන විට මෙම තනතුර සඳහා ඇති හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. මෙම විභාග දැන්වීම මඟින් කැඳවා ඇති සියලුම සුදුසුකම් සනාථ කරන ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කරන්නේ නැත.

06.2 මෙම ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් ලබා ගන්නා මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සරිලන පරිදි සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ.

**07. විභාග ගාස්තුව :-**

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ අංක **"3401"** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා යොමු කළ යුතුයි. මොනයම් හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවන්නේ නැති අතර මෙම ගාස්තුව වෙන විභාගයක් සඳහා මාරු කිරීමට ද අවස්ථාව දෙනු ලබන්නේ නැත.

**08. අයදුම්කරන ක්‍රමය :-**

08.1 මෙම දැන්වීම් අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට සරිලනසේ A4 ප්‍රමාණයේ (සෙ.මී21 x සෙ.මී 29) කඩදාසියේ 1 සිට 10 දක්වා ඡේද පළමු පිටුවේ ද 11 සිට 15 දක්වා ඡේද දෙවන පිටුවේ ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත 05.03.2021 වන දිනට හෝ ඊට ප්‍රථම **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** :393/48, **කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **"උතුරු පළාත් "සාදුසේවිකා" (Saathusevika) III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වූ විවෘත තරඟ විභාගය - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුයි අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නොකරන ලද ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 ඉල්ලුම්පතේ ඡායා පිටපත තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත් යනාදී භාරගනු නොලැබේ. විභාගය සඳහා විභාග ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. **විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීමෙන් අපේක්ෂකයා විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට** අදහස් කරන බවක් සැළකිය නොයුතුයි.

08.4 අයදුම්පත් ඉදිරිපත් කරන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව දන්වා පුවත්පත් නිවේදනයක් ද නිකුත් කරනු ලැබේ. දැන්වීම නිකුත් කර විභාග දිනයට අඩුම

වශයෙන් දින තුනකට (03) පෙර හෝ විභාග ප්‍රවේශ පත්‍ර ලැබුනේ නැතිනම්, එය පිළිබඳ පහත සඳහන් තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක :393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට වහාම දැන්විය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, දුරකථන අංකය - 021 221 9940)

**අමතන විට ඉදිරිපත් කළ යුතු ලියකියවිලි** :-

ආවරණ ලිපියක්, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.5 විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට දැන්වීම් කිසිවක් නිකුත් නොකරන අතර අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම අවශ්‍ය සුදුසුකම් සපුරා නැති අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට ඉඩකඩ ඇති බැවින් මේ පිළිබඳ දැන්වීමක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය ඔප්පු කිරීම :-

අපේක්ෂකයන් තමා පෙනී සිටින එක් එක් විෂයයන් සම්බන්ධයෙන් විභාග අධීක්ෂණ නිලධාරියා තෘප්තිමත් වන පරිදි අපේක්ෂකයන් තම තමාගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් කුමක් හෝ ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත්‍රය

(ii) වලංගු දේශීය බලපත්‍රය.

(iii) රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛනවලින් කුමක් හෝ ලේඛනයක් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය උතුරු පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා, ලේකම්ගේ අභිමතය පරිදි අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

ඉල්ලුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඇතුළත් කළ යුතුයි. මෙම විභාග රේගුලාසි ප්‍රකාර යම්කිසි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ අපේක්ෂකයා සුදුසුකම් සපුරා නැති බව අනාවරණය වූවහොත් අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අපේක්ෂයෙක්ම තම අත්සන සහතික කිරීම අත්‍යාවශ්‍යයි.** රජයේ ආයතනයක් මඟින් අයදුම් කරන අපේක්ෂකයෙක් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මඟින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් බලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුදහමුදා, ගුවන් හමුදාවේ අණදෙන නිලධාරියකු, රුපියල් **498,960.00** ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව සිටින ආගමික නායකයන් යන අයගෙන් කෙනෙකු ස්ථිර කළ යුතු.

## 12. විභාග පටිපාටීන් :-

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් යුත් ප්‍රශ්න පත්‍ර වන අතර මෙය දෙමළ හා සිංහල යන ද්වීත්ව භාෂාවන්ගෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇත. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලබන අතර මෙම ලිඛිත විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් කිසිවෙකුට පිළිතුරු නැවත සමීක්ෂණ කටයුතු සඳහා විධිවිධාන යොදා නැත.

| අංක | කොටස | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | වෙලාව | ලකුණු |
|---|---|---|---|---|---|
| 01. | I කොටස | භාෂා හැකියාව | කෙටියෙන් ලිවීම, ග්‍රහණය කරගැනීම, වැරදි හඳුනාගැනීම, හා පහසු සාහිත්‍යමය භාවිතය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුම මැනීමේ ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 50 |
| 02. | II කොටස | සාමාන්‍ය දැනුම | ආර්ථිකය දේශපාලනය සමාජ සංස්කෘතික හා තාක්ෂණවේදී විෂයන්ට අදාළ දේශීය හා ජාත්‍යාන්තර මට්ටම සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 50 |

**සටහන** :-

මෙම විභාගය තරග විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකටම වෙන්කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් **සියයට හතළිහක් (40%)** ලබාගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරග විභාගයෙන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගනු ලැබේ.

**13.** විභාග අපේක්ෂකයන්ට අදාල විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සියළු දෙනාටම තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**15.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීමේ සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුව ඇත. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**16.** මෙම විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

***එස්. තිරුවාකරන්,***
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
15.02.2021

සිංහල පරිවර්තනය

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සේවා නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සේවා නිලධාරි තනතුරට පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය පැවැත්වීමට නියමිත බව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් දන්වා ඇත. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වනුයේ 05.03.2021 වේ.

### 02. බඳවා ගැනීමේ කොන්දේසීන් :-

02.1 2016.12.10 වන දින සිට බලාත්මකව පවතින සමාජ සේවා නිලධර තනතුරට අදාල සේවා ව්‍යවස්ථා සංග්‍රහය, හා බඳවා ගැනීමේ පටිපාටීන් මඟින් නියම කර ඇති නියෝග ආයතන සංග්‍රහයේ විධිවිධාන මුල්‍ය ප්‍රකාශන හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ **1817/30** වන අංකය දරණ **2013.07.03** වන දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් සේවයට අදාල ආයතන කාර්ය පටිපාටික රීති සංග්‍රහය යනාදීන්ට යටත්ව, තෝරා ගනු ලබන විභාග අපේක්ෂකයන් සමාජ සේවා නිලධාරි තනතුරේ II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ

02.2 තරග විභාගයෙන් සමත් වන විභාග අපේක්ෂකයන් ලබා ගන්නා ඉහළ ලකුණු ප්‍රමාණය හා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සරිලන පරිදි විභාගයෙන් ලබා ගන්නා ලකුණු පදනම මත II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි මෙම තනතුරේ II වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර තුනක් (03) ඉකුත් වීමට ප්‍රථම පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

02.3 මෙම සේවය ස්ථාන මාරුවීම්වලට යටත්වූ සේවා ගණයක් වන අතර මෙම තනතුරට පත් කරන අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

02.1 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත්කිරීමට නියමිත සංඛ්‍යාව **දහයකි**(10). එමෙන් ම දැන්වීම මඟින් පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩුන් හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය. **පවතින පුරප්පාඩුවලින් 70%** විවෘත තරග විභාගයක් මඟින් සම්පූර්ණ කරනු ලැබේ.

### 03 වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, නියම කොට ඇති වැටුප් කාණ්ඩ **MN 5 – 2016** ට අනුව **"සමාජ සේවා නිලධර තනතුර II වන ශ්‍රේණියේ** තනතුරට අදාළ ඒකාබද්ධ වැටුප් අනුපාතය **රුපියල් 34, 605 – 10 x 660 - 11 x755 - 15 x 930 – 63, 460/-** ක් වේ. (රුපියල් 36,585 යන 3වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම 1වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි)

### 04 සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.

04.2 අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි පරිදි මනා ශාරීරික නිරෝගිතාවයකින් යුතු පුද්ගලයකු විය යුතුයි එමෙන්ම මනා චරිතවත් පුද්ගලයකුද විය යුතුයි.

04.3 **අ)** උතුරු පළාත අයදුම්කරුගේ ස්ථිර පදිංචි ස්ථානය විය යුතුයි. මෙම අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට ප්‍රථම වසර හයකින්(06) අවම වශයෙන් වසර තුනක් (03) හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි.

**හෝ**

**ආ)** අයදුම්කරු හෝ අයදුම්කරුවන්ගේ දෙමාපියන් උතුරු පළාතේ උපත ලැබුවන් විය යුතු අතර අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩව පදිංචි වී සිටි පදිංචිකරුවන් විය යුතුයි **(*ඡන්ද නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද සහතික කළ උපුටනයක් ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත්‍රය භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුරට අදාළ සුදුසුකම් සියල්ල අයදුම්කරු විසින් සපුරා තිබිය යුතු යි

04.5 විවෘත තරඟ විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 21 කට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය.

**05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-**

සමාජ අධ්‍යයනය (Sociology),/ සමාජ විද්‍යාව ( Social Science ),/ සමාජ වැඩ (Social Work),/ සමාජව්‍යුහ විද්‍යාව (social Anatomy) / සමාජ මනෝ විද්‍යාව (social Psychology) / ආර්ථික විද්‍යාව (Economics) /භූගෝල විද්‍යාව(Geography)යන විෂයන් එක් විෂයක් කොට ගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්ව විද්‍යාලයකින් ලබාගත් විශ්වවිද්‍යාල උපාධි.

**06. බඳවා ගැනීමේ පටිපාටීන් :-**

06.1 ලිඛිත විභාගයෙන් සමත්වීමට අවම වශයෙන් සෑම විෂයයන්ටම ලකුණු 40% ක් අයදුම්කරුවන් විසින් ලබාගත යුතුයි. ලිඛිත විභාගය මඟින් හා කුසලතාව පදනම් කොට ගෙන, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ කාර්ය පටිපාටීන්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යන කරුණුවලට නැඹුරුව සමාජසේවා නිලධාරින් තනතුරේ II වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම දැන්වීම මඟින් කැඳවා ඇති සුදුසුකම් සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බව අනාවරණය වන අවස්ථාවේදී තනතුර දැරීම සඳහා වූ සුදුසුකම් නැති බව සැලකිල්ලට ගෙන තනතුරට හිමි අයිතිවාසිකම් පහ කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සපුරා ඇති සුදුසුකම්වලට අදාල ලියකියවිලි පරීක්ෂා කරනු ලැබේ ඒ සඳහා ලකුණු ප්‍රදානය කරන්නේ නැත.

**07. විභාග ගාස්තු :-**

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් වටිනා මුදලක් "**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයාගේ,** අංක **"3401"** දරණ තැන්පත් ගිණුමට බැර කර එම ලදුපත අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා යොමු කළ යුතුයි. මොනයම් හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවන්නේ නැති අතර මෙම ගාස්තුව වෙන විභාගයක් සඳහා ද මාරු කිරීමට අවස්ථාව දෙනු නොලැබේ

**08. අයදුම් කිරීමේ ක්‍රමය :-**

08.1 මෙම දැන්වීම් අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට සරිලනසේ A4 ප්‍රමාණයේ (සෙ.මී2x සෙ.මී29) කඩදාසියේ 1 සිට 10 දක්වා ඡේද පළමු පිටුවේ ද 11 සිට 15 දක්වා ඡේද දෙවන පිටුවේ ද ඉතිරි කොටස් අනෙක් පිටුවට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍ර සකස් කළ යුතුයි. பூர்த்தி செய்த අයදුම්පත්‍රය **05.03.2021** වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි "**ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.1 අයදුම්පත් යොමුගත කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**සමාජ සේවා නිලධාරී තනතුරේ II වන ශ්‍රේණියට විවෘත තරඟ විභාගය මඟින් බඳවා ගැනීම**" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් පූර්ණය කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.2 අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් තමා වෙත තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් පිළිගනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. **විභාග සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් අයදුම්කරුවන් සුදුසුකම් සියල්ල පරිපූර්ණ බවට සැළකිය නොයුතුයි.**

*08.3* අයදුම්පත්‍ර යොමු කර ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව පුවත්පත් නිවේදනයක් නිකුත් කරනු ලැබේ. දැන්වීම නිකුත් වීමෙන් අනතුරුව අයදුම්කරුවෙකුට විභාග දිනට අවම දින තුනකට (03) ප්‍රථමයෙන් හෝ ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම් ඒ බව පහත සඳහන් තොරතුරු සමඟ "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව උතුරු පළාත**

**අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට වහාම දැන්විය යුතුයි (**දුරකථන අංකය : 021 221 9939, ෆැක්ස් අංකය 021 001 9940**)

*08.4* **ඉදිරිපත් කළ යුතු තොරතුරු :-**

තොරතුරු අඩංගු ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ පිටපතක්, ප්‍රවේශ පත්‍ර යොමු කිරීමට පහසු වන ෆැක්ස් අංකයක්.

08.6 විභාග අපේක්ෂකයන් විසින් එවන ලද අයදුම්පත්‍ර ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් නරන්නේ නැති අතර අයදුම්පත්‍ර කැඳවනු ලබන අවසන් දිනට ප්‍රථම සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :-

අපේක්ෂකයන් සියළු දෙනාම තමන් පෙනී සිටින සෑම විෂයයන් සඳහාම විභාග අධීක්ෂණ නිලධාරියා සෑහීමකට පත්වන පරිදි තම තමාගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් කුමක් හෝ ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත

(ii) වලංගු ගුවන් බලපත්‍රය.

(iii) රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛනවලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය උතුරු පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා, ලේකම්වරයාගේ අභිමතය පරිදි අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඩුවම් :-

ඉල්ලුම්පත් සම්පූර්ණ කරන විට සත්‍ය තොරතුරු පමණක් ඇතුළත් කළ යුතුයි. විභාග පනතට අනුව යම්කිසි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ සුදුසුකම් සපුරා නැති බව අනාවරණය වුවහොත් සුදුසුකම් සියල්ල එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට අවස්ථාව සැළසෙනු ඇත.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අපේක්ෂයන් විසින්ම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.** රජයේ ආයතනයක් මඟින් අයදුම් කරන අපේක්ෂකයෙක් තම ආයතන ප්‍රධානියා හෝ මහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මඟින් සහතික කර ගත යුතුයි. . අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුදහමුදා, ගුවන් හමුදාවේ අණදෙන නිලධාරියකු, රුපියල් 498,960.00 ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව සිටින ආගමික නායකයන් වැනි කෙනෙකු ස්ථිර කළ යුතුයි.

## 12. විභාග පටිපාටීන් :-

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වන අතර මෙය දෙමළ භාෂාවෙන් පැවැත්වීමට නියමිත වි ඇති අතර සුදුසුකම් සපුරා ඇති සිංහල භාෂා මාධ්‍යයට අයත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත්‍ර යොමු වන විට සිංහල මාධ්‍යය මඟින් ද විභාගය පැවැත්වීමට කටයුතු සලසනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.

**විෂය මාලාව** .:-

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ ගණිතමය හැකියාව, තර්කානුකූල හැකියාව, තීරණ ගැනීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව, යනාදි හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. | පැය **01** යි | 100 |
| 02. | විෂයානුබද්ධ සාමාන්‍ය දැනුම | දේශීය හා ජාත්‍යාන්තර වශයෙන් වූ දේශපාලනය, ආර්ථික හා දුර්වල සමාජයේ ආරක්ෂාව යන කරුණු සමග සම්බන්ධ ප්‍රායෝගික කරුණු, ගැන විභාග අපේක්ෂකයන්ගේ දැනුම මැනීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. | පැය **01** යි | 100 |
| 03 | රචනා හා කෙටියෙන් ලිවීම | වර්තමාන සමාජය, ආර්ථිකය, දේශපාලන තත්වය, දුර්වල සමාජීය ආරක්ෂාව යන කරුණු අන්තර්ගත වනු ඇත. | පැය **01** 1/2 යි | 100 |

13. විභාග අපේක්ෂකයන්ට අදාල විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් නිකුත් කරන අතර විභාගයට පෙනී සිටිමට අපේක්ෂා කරන අපේක්ෂකයන්ට තැපැල් මගින් නිකුත් ද කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීමේ සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුව ඇත. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

15. ශීර්ෂගත විභාග නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

***එස්. තිරුවාකරන්,***
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත
15.02.2021

සිංහල පරිවර්තනය

# උතුරු පළාත් රාජ්‍ය සේවයේ සංඥා භාෂා පරිවර්තක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021

උතුරු පළාත් රාජ්‍ය සේවයේ සංඥා භාෂා පරිවර්තක III වන ශ්‍රේණියට පවතී පුරප්පාඩුවක් **(01)** සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගයක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පැවැත්වීමට නියමිත බව දන්වා ඇත. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 05.03.2021 වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 2019.04.06 වන දින සිට ක්‍රියාත්මකව පවතින ඒකාබද්ධ සේවාවන් හි **සංඥා භාෂා පරිවර්තක** තනතුරට අදාළ වූ සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්, මුදල් රෙගුලාසීන්, හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30හා 2013.07.03වන දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා නියමිත ආයතන කාර්ය සංග්‍රහය යනාදීන්ට හා මතු පැමිණෙන කාලවලදී සිදුවීමට නියමිත කිසියම් සංශෝධනයන්ට ද යටත්ව තෝරා පත් කර ගන්නා විභාග අපේක්ෂකයන් **සංඥා භාෂා පරිවර්තක තනතුරේ III වන ශ්‍රේණියට** පත් කරනු ලැබේ.

02.2 තරඟ විභාගය මඟින් පත්වීමට තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් පත්වන දින සිට වසර තුනක් (03) පරිවාස කාලයට යටත් කර **සංඥා භාෂා පරිවර්තක තනතුරේ III වන ශ්‍රේණියට** පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යාවස්ථාවේ සඳහන් පරිදි **සංඥා භාෂා පරිවර්තක තනතුරේ III වන ශ්‍රේණියට පත් වූ දින සිට වසර (03) ක් ඉකුත්වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම්** විභාගය සමත් විය යුතුයි.

02.3 මෙම සේවය ස්ථාන මාරු සහිත සේවයක් වේ. එබැවින් මෙම පත්වීම් සඳහා පත් කර ගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

## 03. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016පරිදි, වැටුප් කාණ්ඩය MN 1 – 2016පරිදි ද **භාෂා පරිවර්තක තනතුරේ III වන ශ්‍රේණියට** අදාළ ඒකාබද්ධ වැටුප් අනුපාතය රුපියල් **27, 140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45, 540/-වේ**. (රුපියල් 28,040 ක් වන වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීම අනිවාර්ය වේ)

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි..

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය වන පරිදි ශාරීරික වශයෙන් නිරෝගී පුද්ගලයන් විය යුතු අතර මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු ද විය යුතුයි.

04.3 **අ)** අයදුම්කරුවන් උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට ප්‍රථමයෙන් වන වසර හයක (06) කාල පරිච්ඡේදය තුළ දී අවම වශයෙන් වසර තුනක් (03) උතුරු පළාත තුළ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**හෝ**

**04.4** **ආ)** අයදුම්කරුවන් හෝ දෙමාපියන් උතුරු පළාතේ උපත ලැබූ අය විය යුතුයි අවම වශයෙන් වසර පහක් (05)හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි **(සම්මුඛ පරීක්ෂණයේ දී ඡන්ද හිමි නාම ලේඛණයෙන් උපුටා ගන්නා ලද උපුටනයක් ඉදිරිපත් කළ යුතුයි)**

04.5 අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවා ඇති **සුදුසුකම් සියල්ල** අපේක්ෂකයන් විසින් සපුරා තිබිය යුතුයි.

04.6

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අපොස (සා/පෙ) විභාගයෙන් එකවර **භාෂාව** (දෙමළ/සිංහල/ඉංග්‍රීසි) **ගණිතය** ඇතුළු විෂයයන් **හතරකට (04)** සම්මාන සමාර්ථයන් සහිතව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමගම**

අපොස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් **එක් විෂයක් (01)** සමත් වී තිබිය යුතුයි. (පොදු පරීක්ෂණය හැර)

**(ආ) වෘත්තීය සුදුසුකම් :-**

අයදුම්කරුවන් අවම වශයෙන් මාස හයකට (06) නොඅඩු සංඥාභාෂා ඩිප්ලෝමා සහතික පත්‍ර ශික්ෂණ පාඨමාලාවක් රජයේ ආයතනයකින් හෝ රජයේ අනුමැතිය ලත් ආයතනයකින් සාර්ථකව හදාරා සම්පූර්ණ කර තිබිය යුතුයි.

**(ඇ) වයස් සීමාව :-**

අයදුම්පත භාරගන්නා අවසන් දිනට අයදුම්කරුගේ **වයස අවුරුදු 18 නොඅඩු, හා වයස අවුරුදු 30 නොවැඩි** විය යුතුයි..

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ලිඛිත විභාගයෙන් සමත්වීමට අවම ලකුණු 40% ක් සෑම විෂයයකටම ලබාගත යුතුයි. ලිඛිත විභාගය මගින් හා කුසලතාව පදනම් කරගෙන, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදියට නැඹුරුව **සංඥා භාෂා පරිවර්ථක තනතුරේ III** වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් අයදුම්කරුවන්ගෙන් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වන විට මෙම තනතුර සඳහා හිමිවන අයිතිවාසිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී කැඳවා ඇති සුදුසුකම් සනාථ කරන ලියකියවිලි පරීක්ෂාවට ලක් කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේ දී ලකුණු ප්‍රදානය කරන්නේ නැත.

06.2 ඉහත ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයන් ලකුණු අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සඳහා පත්කර ගැනීමට සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

## 07. විභාග ගාස්තු :-

අපේක්ෂකයන් පදිංචි වී සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් 500.00 ක් ගෙවා **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන ගිණුමට මුදල් බැර කළ කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා එවිය යුතුයි. මොනම හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන අතර මෙම ගාස්තුව වෙනත් කිසියම විභාගයක් සඳහා මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

## 08. අයදුම්කරන ක්‍රමය :-

08.1 මෙම දැනවීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (21 සෙ.මී x 29 සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා තිබෙන ඡේද පළමු පිටුවේ ද, 11 සිට 15 දක්වා තිබෙන ඡේද දෙවන පිටුවේ ද, ඉතිර කොටස් අනෙක් පිටුවේ ද ආවරණය වන පරිදි අයදුම්පත සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත 05.03.2021 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත / අයදුම්පත් යොමු කරන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"සංඥා භාෂා පරිවර්තක තනතුරේ සසස වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාග - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා, අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්පතේ ඡායා පිටපත ඔබ බාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. **විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුමකරුවන්ට ප්‍රවේශපත් නිකුත් කළ පසු ඒ පිළිබඳව පුවත්පත් මගින් දැන්වීමක් නිකුත් කරනු ලැබේ. දැන්වීම පළවූ පසු යම්කිසි අපේක්ෂකයකුට අවම වශයෙන් විභාගය පැවැත්වීමට නියමිත දින තුනකට (03) ප්‍රථම හෝ ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්, ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමඟ, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්වීමට කටයුතු කළ යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, ෆැක්ස් අංක - 021 221 9940)

**ඉදිරිපත් කළ යුතු ලියකියවිලි :-**

තොරතුරු ඇතුළත් කළ ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.5 විභාගයට අයදුම් කරන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සුදුසුකම් සම්පූර්ණ කර නැති අපේක්ෂකයන්ගේ අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ හා සම්බන්ධ දැන්වීම් කිසිවක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයන්ටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම් පත
(ii) වලංගු විදේශ ගමන්බලපත්‍රය.
(iii) රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, ගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් පනවනු ලබන දඬුවමට යටත් වීමට සිදුවේ.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතා අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග නීතිරීති ප්‍රකාර කිසියම් අපේක්ෂකයෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ වූව ද සුදුසුකම් සම්පූර්ණ කර නැති බවට අනාවරණය වන්නේ නම්, එම අපේක්ෂකයාගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බවට ඔප්පු වුවහොත් ඕනෑම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට ඉඩකඩ සැලසෙනු ඇත.

## 11. අත්සන සහතික කිරීම :-

**අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ.** රජයේ ආයතනයක් මගින් අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධරයකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සාම විනිසුරු, දිවුරුම් නිලධාරී, නීතිඥවරයකු, නොතාරිස්, නාවික හමුදා, යුද හමුදා, ගුවන් හමුදාවන්හි සේවයේ නියුතු නියෝගලත් නිලධාරියකු, රුපියල් 498,960.00 ට නොඅඩු වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව කටයුතු කරන පූජක පක්ෂයේ පූජකයකු විසින් සහතික කළ යුතුයි.

## 12. විභාගය පරිපාටිය :-

මෙම විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර දෙමළ භාෂා මාධ්‍යය මගින් විභාගය පැවැත්වීමට නියමිතය. එසේ වුවද සුදුසුකම් සපුරා ඇති සිංහල මාධ්‍යය මගින් වූ අයදුම්පත් යොමු වුවහොත් සිංහල භාෂා මාධ්‍යයෙන් ද විභාගය පැවැත්වීමට කටයුතු යොදනු ලැබේ. අයදුම් කරන භාෂාව පසුව වෙනස් කිරීම ඉඩ නොදෙනු ලැබෙන අතර විෂය මාලාව පහත සඳහන් පරිදි සමන්විත වේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතා පරීක්ෂණය | අංක ගණිතය හා තර්කානුකූල කරුණු හා සාමාන්‍ය අභියෝග්‍යතා සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයන් තුළ පවතින දැනුම පරීක්ෂා කිරීමේ අරමුණින් යුත් ප්‍රශ්න අඩංගුයි | පැය 01 | 100 |
| 02. | භාෂණ හැකියාව | කෙටියෙන් ලිවීම, අවබෝධය, වැරදි හඳුනා ගැනීම හා සරල ව්‍යාකරණ භාවිතය සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයන් තුළ පවතින දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ | පැය 01/30 | 100 |

**13.** අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවිය මගින් නිකුත් කරනු ලැබේ. අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයන්ටම තැපැල් මගින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධ බලතල පැවරී ඇත්තේ උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාටයි. මෙම දැන්වීම දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන්ගෙන් පළ කරන අතර එම භාෂා මාධ්‍යයන් අතර යම් කිසි නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම් දෙමළ භාෂා මාධ්‍යයේ දැන්වීම පරිදි කටයුතු කරනු ලැබේ.

**15.** මෙම විභාගය සම්බන්ධයෙන් වූ දැන්වීම www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් ලබාගත හැකිය.

**එස්. තිරිවාකරන්**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
15.02.2021